**#mediaethicsSL #SinhalaPress #lka #Mawbima #August17**

රුධිර පරිත්‍යාගශීලීන්ගෙන් ලබාගත් රුධිර සාම්පලයන් පරීක්ෂා කිරීමේදී එයින් එච්.අයි.වී. වෛරසය සහිත රුධිර සාම්පලයන් තිහක් හමුවී ඇතැයි යන පුවත මව්බිම මගින් සවිස්තර සංඛ්‍යාලේඛණයන්ද සහිතව දක්වා තිබිණි. කෙසේ නමුත් මෙහිදී අවධානයට යොමු විය යුතු වන්නේ ලිපියේ සිරස්තලයයි. එම සිරස්තලය තාක්ෂණිකව වැරදි සහගත බවක් හෝ නොමඟ යවන සුළු බවක් පැවසිය නොහැක. එසේ වුවත් "ලේ බැංකුවට දන් දුන් ලේ පැකට් 30 ක ඒඩ්ස්" යනුවෙන් වන සිරස්තලයකින් එක් වරම පාඨකයාගේ මනසට කාවදින අදහස වන්නේ ලේ බැංකුවෙන් ලබාදෙන රුධිරය අවදානම් සහගත බව විය හැක. නමුත් ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානයට ලබාදෙන රුධිර සාම්පලයන් පරීක්ෂා කිරීමකින් තොරව මුදානොහරින බවද වඩාත් පැහැදිලිව අවධාරණය වූයේ නම් එම ගැටළුව පැන නොනඟිනු ඇත.